දුරකථන ) 0112669192 ,0112675011
தொலைபேசி 0112698507 , 0112694033
Telephone ) 0112675449 ,0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
)0112692913

විද්‍යුත් තැපෑල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி
e-mail

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம்
website )

මගේ අංකය )
எனது இல )
My No. ) CF/EXJ/02/2022

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) 2022/05/05
Date )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

සෞඛ්‍ය අමාත්‍යාංශය
சுகாதார அமைச்சு
Ministry of Health

පොදු චක්‍රලේඛ ලිපි අංක :- 02 - 40 /2022

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී ලංකා ජාතික රෝහල,
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
රේඛීය අමාත්‍යාංශ යටතට ගැනෙන සියලුම රෝහල් අධ්‍යක්ෂවරුන්,
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
අදාල ආයතන ප්‍රධානින් වෙත.

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ (MN -03 -2006 (ඒ)) දෙපාර්තමේන්තුගත තනතුරු සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2022 (පළමු වාරය)**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ (MN-03 2006 (ඒ)) II ශ්‍රේණියට උසස් වී වසර තුනක් ගතවීමට පෙර සමත් වියයුතු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2022/05/28 හා 2022/05/29 දිනයන්හි සිංහල දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන ස්ථානය හා වේලාව ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

## 02. සුදුසුකම්

මෙම විභාගයට අයදුම්කල හැක්කේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ (MN-03 2006 (ඒ)) II ශ්‍රේණියට උසස්වීම් ලබා සිටින හා මේ වනවිට එම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණකර නොමැති ජායාරූප ශිල්පි, විදුලි සෝපාන ශිල්පි, වායුසමීකරණ තාක්ෂණික ශිල්පි, යන්ත්‍ර පරිපාලක, ප්‍රවාහන නිලධාරි, ප්‍රවාහන වැඩමුලික, විදුලි ශිල්පි, සැළසුම් ශිල්පි, කාර්මික නිලධාරි (සිවිල්), කාර්මික නිලධාරි (විදුලි) යන තනතුරුවල නියුතු නිලධාරින්ට පමණි.

සැ: යු: - **2021/12/31 දින වනවිට II ශ්‍රේණියට පත්කර අදාල පත්වීම් ලබා සුදුසුකම් සපුරා ඇති නිලධාරින්ගේ අයදුම්පත් පමණක් මා වෙත එවීමට කටයුතු කරන්න.**

## 03. අයදුම්පත්

මෙම චක්‍රලේඛ ලිපිය අවසානයේ දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරු විසින් සකස් කරගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින්, අධ්‍යක්ෂ (විභාග) අංක 385, "සුවසිරිපාය" සෞඛ්‍ය අමාත්‍යාංශය, පූජ්‍ය බද්දේගම විමලවංශ නාහිමි මාවත, කොළඹ 10. වෙත **2022/05/20** දින හෝ ඊට පෙර ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. සෑම අයදුම්පතකම දක්වා ඇති තොරතුරු නිවැරදි බව ආයතන ප්‍රධානියා විසින් සහතිකකර තිබිය යුතුය.
තම අයදුම්පත සමග රාජකාරි ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලියන ලද රු.45.00 ක් වටිනා මුද්දර ඇලවූ "9 × 4" ප්‍රමාණයේ ලියුම් කවර 01ක් ද එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්‍ර, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සැ.යු. :- ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව, අයදුම්පත්‍රය $A_4$ කඩදාසියක පළමු පිටුවේ අංක 01 සිට 04 දක්වාත් දෙවන පිටුවේ අංක 05 සිට 09 දක්වාත් සකස් කළ යුතුය. ඉහත ආකෘතියට අනුකූල නොවන සියලුම අයදුම්පත්‍ර තැවත දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

## 04. විභාග ගාස්තු

I. විභාගයට පළමුවන වරට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු.25/- බැගින් අවලංගු නොකල මුද්දර අයදුම්පත්‍රයේ අලවා තමන්ගේ අත්සන හා දිනය යොදා අවලංගු කළයුතුය.

II. කිසිදු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදුකරනු නොලැබේ.

05. විභාගයට ඇතුළත් කරගැනීම

I. පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයන්ට ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණකර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළයුතුය. එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

II. විභාග අපේක්ෂක /අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුළදී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය තහවුරු කළයුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළයුතුය.

(අ) ජාතික හැඳුනුම්පත
(ආ) සෞඛ්‍ය අමාත්‍යාංශය හෝ ඊට අදාළ ආයතනයක් මගින් විධිමත් ලෙස නිකුත් කරන ලද හැඳුනුම්පත
(ඇ) වලංගු රියදුරු බලපත්‍රය
(ඈ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

06. විභාග පටිපාටිය

මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සෑම තනතුරක් සඳහාම ආයතන සංග්‍රහය, මූල්‍ය ක්‍රම හා දෙපාර්තමේන්තු රෙගුලාසි යනුවෙන් ප්‍රශ්න පත්‍ර තුනකින් යුක්ත වන අතර, එක් එක් විෂයය සඳහා ලකුණු 100 බැගින් වෙන් කෙරේ. සමත්වීම සඳහා සෑම කොටසකටම අවම වශයෙන් ලකුණු 40 ක් ලබාගත යුතුය. එක්වරකදී හෝ කිහිපවරකදී විෂයන් වශයෙන් පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකිය. පළමුවරට විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් සියලුම විෂයයන් අයදුම් කළයුතුය.

07. විෂය නිර්දේශ මාලාව

07.1 දෙපාර්තමේන්තු රෙගුලාසි ප්‍රශ්න පත්‍රය

මෙම ප්‍රශ්න පත්‍රයේ සියලුම තනතුරු සඳහා දෙපාර්තමේන්තුවේ තාක්ෂණික කටයුතුවලට අදාල කරුණුවලට අමතරව දෙපාර්තමේන්තු රීති හා රෙගුලාසි, පනත්, ක්‍රියා පිළිවෙත් ආදියට අදාළව හා රෝගී සත්කාර සේවාව සහ ප්‍රජා සෞඛ්‍ය සේවාවට අදාලව චක්‍රලේඛ හා උපදෙස් මත සැකසේ. කාලය පැය දෙක හමාරකි (2 ½). රචනා මාදිලියේ ප්‍රශ්න හතකින් සමන්විතය. එයින් ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සැපයිය යුතුයි.

07.2 කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

07.2.1 ආයතන සංග්‍රහය ප්‍රශ්න පත්‍රය

මෙම ප්‍රශ්න පත්‍රය කාලය පැය (2½) රචනා මාදිලියේ ප්‍රශ්න (08) අටකින් සමන්විත අතර එයින් ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සැපයිය යුතුයි.

❖ ආයතන සංග්‍රහයේ පහත පරිච්ඡේද මත සැකසේ

| | | | |
|---|---|---|---|
| XV | වන පරිච්ඡේදය | - | අධ්‍යාපන, අභ්‍යාස හෝ රාජකාරී කටයුතු සඳහා පිටරට යාම |
| XVI | වන පරිච්ඡේදය | - | නිවාඩු ගමන් |
| XXIII | වන පරිච්ඡේදය | - | ඇතැම් වර්ගවල ලෙඩ රෝගවලින් පෙළෙන රජයේ නිලධාරීන්ට විශේෂ අනුග්‍රහ සහ ඒ පිළිබඳ කොන්දේසි |
| XXIV | වන පරිච්ඡේදය | - | වැටුප් ණය සහ අත්තිකාරම් |
| XXV | වන පරිච්ඡේදය | - | වෘත්තීය සංගම්වල සාමාජිකයින්ට අනුග්‍රහ |
| XXVII | වන පරිච්ඡේදය | - | ලිපි ගනුදෙනු කිරීමේ මාර්ග |
| XXVIII | වන පරිච්ඡේදය | - | පරිපාලන කාර්ය පරිපාටි සහ විධි |
| XXX | වන පරිච්ඡේදය | - | රජයේ නිලධාරීන් සම්බන්ධයෙන් ආණ්ඩුව සතු බලතල |
| XXXIII | වන පරිච්ඡේදය | - | නීති උපදෙස් සහ නීති ක්‍රියාමාර්ග |
| XLVII | වන පරිච්ඡේදය | - | සාමාන්‍ය හැසිරීම සහ විනය |
| XLVIII | වන පරිච්ඡේදය | - | විනය කාර්ය පරිපාටි නිලධාරීන්ගේ කාර්ය සාධන සහ ඇගයීම් පිළිබඳ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ |

07:2:2. මූල්‍ය ක්‍රම ප්‍රශ්න පත්‍රය

මෙම ප්‍රශ්න පත්‍රය සඳහා කාලය පැය (2½) කි. රචනා මාදිලියේ ප්‍රශ්න (08) අටකින් සමන්විතය. ඉන් ඕනෑම ප්‍රශ්න 05කට පිළිතුරු සැපයිය යුතුය. මුළු ලකුණු 100කි.

මුදල් රෙගුලාසි සංග්‍රහයේ පහත පරිච්ඡේද මත සැකසේ.

| | | |
|---|---|---|
| VI වන පරිච්ඡේදය | - | ආණ්ඩුවේ මුදල් යනාදියෙහි භාරකාරත්වය, අග්‍රිමය සහ බැංකු ගිණුම්, රාජ්‍ය මූල්‍ය සුරක්ෂිතභාවය, සමීක්ෂණ මණ්ඩල, අයිරාව බැංකු ගිණුම්. (මු. රෙ. 315 සිට මු. රෙ. 396 දක්වා) |
| XIII වන පරිච්ඡේදය | - | සැපයීම් වැඩ සහ සේවා ( මු. රෙ. 708 සිට මු. රෙ. 775 දක්වා) |

**08.** විභාග සම්බන්ධ රෙගුලාසි අනුගමනය කිරීම

අපේක්ෂකයින් විසින් වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ කුමන හෝ පොතකින්, හෝ කවර ආකාරයක සටහන් සහිත කොලයකින්, හෝ වෙනත් කිසිවකින් හෝ බලා පිළිතුරු ලිවීම තහනම්ය. වෙනත් අපේක්ෂකයෙකුගේ පිළිතුරු පත්‍රය දෙස බැලීමද නොකළ යුතුය. එසේම වෙනත් අයදුම්කරුවෙකුට උදව් කිරීමෙන් හෝ වෙනත් අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් උදව් ලබාගැනීමෙන්ද වැළකී සිටිය යුතුය. තවද ජංගම දුරකථන හා ඒ හා සමාන සන්නිවේදන හා විද්‍යුත් උපකරණද භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතුය. මෙම නීති කඩකරනු ලබන ඕනෑම අපේක්ෂකයෙකු දඬුවම් ලැබීමට යටත්වනු ඇත.

**09.** කරුණාකර මෙම චක්‍රලේඛ ලිපියේ අඩංගු දෑ ඔබ ආයතනයේ නියුතු අදාල නිලධාරීන්ගේ දැනගැනීමට සලස්වන්න. මෙම තොරතුරු **www.health.gov.lk** වෙබ් අඩවියේද ඇතුලත් කර ඇත.

සැ.යු. - මෙම චක්‍රලේඛ ලිපියේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි නිවේදනයන්හි පාඨ අතර යම් අනනුකූලතාවයක් මතුවුවහොත් සිංහල මාධ්‍ය විභාග නිවේදනය බලපැවැත්වේ.

චාමික එච් ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) 11
ලේකම් වෙනුවට
සෞඛ්‍ය අමාත්‍යාංශය

චාමික එච්. ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

EXJ

ආදර්ශ අයදුම්පත

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |
|---|
| |

සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ (MN -03 -2006 (ඒ)) දෙපාර්තමේන්තුගත තනතුරු සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2022 (පළමු වාරය)

01. (අ) i. අයදුම්කරුගේ සම්පූර්ණ නම (සිංහලෙන්) - ..............................................................
..............................................................

ii. අයදුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) -

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | |

iii. මුලකුරු සමඟ නම (සිංහලෙන්) ..............................................................
..............................................................
..............................................................

iv. මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) –

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |

(ආ) i. තනතුර - ..............................................................

ii මෙම තනතුරට අදාළ පත්වීම් දිනය - ..............................................................

ලිපි අංකය - ..............................................................

iii දැනට ලබන වාර්ෂික වැටුප - ..............................................................

iv ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

v ජංගම දුරකථන අංකය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

vi විද්‍යුත් ලිපිනය - ..............................................................

02. ඔබ මෙවර පෙනිසිටීමට බලාපොරොත්තු වන විෂයයන් ඉදිරියේ ඇති කොටුව තුල (√) ලකුණ යොදන්න. පෙනී නොසිටින්නේ නම් (X) ලකුණ යොදන්න.

දෙපාර්තමේන්තු රෙගුලාසි ☐ මූල්‍ය ක්‍රම ☐

ආයතන සංග්‍රහය ☐

03. (අ) දැනට සේවය කරන ආයතනය :– සිංහලෙන් ..............................................................

ඉංග්‍රීසියෙන් ..............................................................

(ආ) මෙම ආයතනය අයත් වන්නේ :– මධ්‍ය අමාත්‍යාංශයට ☐ පළාත් සභාවට ☐

(ඇ) පළාත් සභාවට නම් අදාල පළාත :– ..............................................................

(ඈ) එය අයත් දිස්ත්‍රික්කය - ..............................................................

(ඉ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා නිවැරදිව හා පැහැදිලිව ලිපිනය ලියන ලද "9×4" ප්‍රමාණයේ රු45.00ක මුද්දර ඇලවූ ලියුම් කවර 01ක් අයදුම්පත්‍රයට අමුණන ලද්දේද? ..............................

(ඊ) 1. තැපැල් ලිපිනය (සිංහලෙන් හෝ ඉංග්‍රීසියෙන්) -..............................................................
..............................................................

2. තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) -..............................................................
..............................................................

04. විභාගයට පෙනී සිටින මාධ්‍යය-(සිංහල/දෙමළ/ඉංග්‍රීසි) - ..............................................................

05. (අ) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේද? ..........................................................................

(ආ) අයදුම්පත ඉදිරිපත් කරන්නේ ප්‍රථම වරට නොවේනම් මුද්දර අලවා තිබේද? ..................

මුද්දර කොටුව

06. අයදුම්කරුගේ සහතිකය

මගේ දැනුම හා විශ්වාසය පරිදි,

(I) මෙම අයදුම්පත්‍රයේ සඳහන්කර ඇති තොරතුරු සත්‍ය බවත්, මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත්/ප්‍රථම වතාවට නොවන බැවින් රු.....................ක් වටිනා මුද්දර අලවා ඇති බවත්* මෙම අයදුම් පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(II) සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීතිවලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකග වන බවත් මෙයින් සහතික කරමි.

.................................

දිනය ......................................... අයදුම්කරුගේ අත්සන

07. පෞද්ගලික ලිපිගොනු භාර විෂය නිලධාරියාගේ සහතිකය

මෙම අයදුම්පත භාරගන්නා අවසාන දිනයට පෙර මා වෙත භාරදුන් බවත්, පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරුවලට අනුව අයදුම්කරු විසින් නිවැරදිව මෙම අයදුම්පත සම්පූර්ණකර ඇති බවත්, මෙම අයදුම්පතේ පිටපතක් පෞද්ගලික ලිපි ගොනුවට ගොනුකළ බවත් සහතික කරමි.

.......................................

දිනය :-.................................... නම සහ අත්සන

08. ආයතන ප්‍රධානියාගේ සහතිකය

.............................................................................මහතා/මිය/මෙනෙවිය*................................නිල ධාරියකු වශයෙන් මෙම ආයතනයේ සේවය කරන බවටත්, විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වරට/නොවන* බවටද රු ............ ක් වටිනා මුද්දර මෙම ඉල්ලුම්පත්‍රයට අලවා ඇති බවද/මුද්දර ඇලවීමට අනවශ්‍ය බවටද* අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි. මා ඉදිරිපිටදී අත්සන් කළ බවද සහතික

.................................

දිනය :- ...................................... ආයතන ප්‍රධානියාගේ අත්සන

[රබර් මුද්‍රාව තැබිය යුතුය]

09. විමධ්‍යගත කොට්ඨාශ / විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ සහතිකය

............................................................................ මහතා/මහත්මිය/මෙනවිය, සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ (MN-03 2006 (ඒ)), II ශ්‍රේණියේ නිලධාරියෙකු වශයෙන් මගේ ආයතනයේ සේවය කරන බවත්, අයදුම්පතේ දි තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

දිනය :- ...................................... ...........................................

විමධ්‍යගත කොට්ඨාශ / විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ

අත්සන [රබර් මුද්‍රාව තැබිය යුතුය]

*( අනවශ්‍ය කොටස් කපා හරින්න.)